THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 1 - Issue II
December 2021

**T J O L C**
ISSN 2806-5395

**Category: Research Article**

# මාතලේ දිසාවේ විෂ්ණු දෙවියන් පුදලබන පූප මංගල්ලය

## (දඩුබැදිරුප්පාව ග්‍රාමය ඇසුරින් කෙරෙන සමාජ සංස්කෘතික මානව විද්‍යාත්මක අධ්‍යයනයක්)

**හර්ෂණී කේ. මිල්ලගහතැන්න**

**ARTICLE DETAILS**

Published Online & Printed
December 2021

***Author:***

**හර්ෂණී කේ. මිල්ලගහතැන්න**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
භාෂා අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා හා
මානවශාස්ත්‍ර පීඨය, රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.
*Email: harshimtc2010@yahoo.com*

මුඛ්‍යපද:
අභිචාර, සංස්කෘතිකක්‍රියාවලි, විශ්වාස, සශ්‍රීකත්වය

**සංෂිප්තය**

Rituals are an alternate system of belief that can be used for the logical ideas of the human being. Although there isn't a full vision , it gives a courage to the human being (Rathnayake,1999). Imitations of rituals refers as witch-crafting by James George Frazer. Also he points out this witch-crafting is used by people around the world to do harmful things to the society (black magic) as well as for benifits, peace and well-being (white magic) (Frazer, 1994:62). It is not difficult to understand by the researches of anthropologists as Jemes Frazer,R.R.Mariette, Bronislaw Malinowski,Tylor that the role played by human from primary stage to the Invisible Powers in social and cultural evolution is not insignificant.

## හැඳින්වීම

අභිචාර, පුරාවෘත්ත, කලා හා විද්‍යා ආදිය ඓන්ද්‍රීය බද්ධව පවතින්නේ ඒ ඒ සංස්කෘතියේ දක්නට ලැබෙන දැනුම් පද්ධතිය අනුවය. මේ නිසා ආගම සහ අභිචාර කලාවන් සම්බන්ධ දැනුම් පද්ධතිය ඕනෑම සංස්කෘතියක අනන්‍යතාවයටත් පුද්ගලයන්ගේ සහ සමාජයේ යහපැවැත්මටත් ඉතාම වැදගත් කාර්යභාරයයක් ඉටුකරයි.

සශ්‍රීකත්වය පෙරදැරි කොටගෙන ලොව බොහෝ රටවල ජනයා විවිධාකාර වූ අභිචාරවිධීන් හි නියැලෙත් (frazer,1994:69). කෘෂි කර්මාන්තය ප්‍රමුඛ ජීවනෝපාය කරගත් ලාංකේය ජන සංස්කෘති තුළ ද ඒ හා සබැඳි අභිචාරයන්ට හිමිවන්නේ වෙසෙස් තැනකි. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට පැවත ආ මෙකී අභිචාර, අද්‍යතනයේ ද ඇතැම් ප්‍රදේශයන්හි අවිනෂ්ටව පවතී.

නිසි කලට වැසි ලැබ රෝග පීඩාදියෙන් විනිර්මුක්තව කෘෂිභෝගයන්ගේ අස්වැන්න නෙලා, අටුකොටු පුරවාගත් හෙළ ගොවියෝ ඔවුන්ගේ බාහිර හා අභ්‍යන්තර ජීවිතය සුඛිත මුදිත කළ සොබාදහමට පෙරළා කළගුණ දැක්වීමට කිසිවිටකත් අමතක නොකළහ. ඒ අනුව පොළවට, වැවට, ගමට, ලන්දට, හරකාබානට අධිගෘහිත දෙවි දේවතාවන්ට හා වෙනත් බලවේගයන්ට පුද පූජා පවත්වා භාරහාර වී කෘෂිකාර්මික කටුයතු සිදු කිරීමෙන් ශස්‍ය සම්පත් වර්ධනය වී සෞභාග්‍යය හා සශ්‍රීකත්වය සිදුවන බවත් ඔවුහු තරයේ විශ්වාස කරති(ආරියපාල,1962). ලාංකේය ගැමි සමාජ සන්දර්භය තුළ පවත්නා ගැමි ආගමෙහි වන්දනීයත්වයට සහ පූජනීයත්වයට පත්ව ඇති යක්ෂ හා දේව සමූහයා විෂයෙහි උක්ත ශාන්ති කර්ම සහ දේව මංගල්ල සිදුකෙරේ.

ස්වභාව ධර්මය සමඟ සහජීවන පැවැත්මක් උදෙසා නිර්මාණය කර ගන්නා ලද සම්මුතීන් ඔස්සේ ලැබූ අත්දැකීම් හා අත්විඳීම් මත පදනම් වී උරුම කොට ගත් උක්ත දැනුම් සම්භාරයන් පරම්පරාවෙන් පරම්පරාවට වාච්‍යාර්ථයෙන් පවත්වා ගෙන එනු ලැබ ඒවා සියල්ල සම්ප්‍රදායන් බවට පත් අයුරු ජන ශිෂ්ටාචාරයේ ස්ථර විමර්ශනය කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කොට ගත හැකිය.

## පර්යේෂණ අරමුණු

මාතුළ දිසාවේ දඩුබැඳිරුප්ප ගම්වාසීන් වර්ෂයක් පාසා පවත්වනු ලබන පුප මංගල්ලය හෙවත් කැවුම් මංගල්ලයේ අභ්‍යන්තර හරය හා බද්ධ වු අරමුණු රාශියක් අපගේ පර්යේෂණය තුළින් අනාවරණය කරගත හැකිවිය.

- ප්‍රාථමික ස්වභාවික නීතිය (Natural Low) පිළිගනිමින් ඒවා ක්‍රියාත්මක කරමින් මානව අවශ්‍යතා ඉටුවන අයුරු විමසීම

- පාරම්පරික දැනුම (Indigenous Knowledge) හා ගැමි ආගමික විශ්වාස අතර පවතින සහසම්බන්ධතාවයෙන් ස්වභාව දහම පූජනීයත්වයට පත්වන ආකාරය විමසීම.

- ගැටළු නිරාකරණය සාමකාමීව ගැටීමේ විධි සාමුහික ක්‍රියා (Community Action) විනිශ්චය කිරීම් පුද්ගල අපේක්ෂා හා ආරක්‍ෂණ ක්‍රමවේද පිළිබඳ විමසුම. (Adjudication)

- සමාජය හා සංස්කෘතිය ආරක්ෂණය සඳහා පාරම්පරික ඥානය අන්තර්ගත වූ යාතු කර්ම වල ඇති වටිනාකම සොයා බලා මතු පරපුරට දායාද කිරීම.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ වෙනත් කිසිදු ප්‍රදේශයක දක්නට නොලැබෙන විශේෂිත පිළිවෙත් හා පුජා පටිපාටියක් සහිත දඩුබැඳිරුප්පාවේ විෂ්ණු දෙවියන් පුදන පුප මංගල්ලය මඟින් තත් පෙදෙස් වැසියන්ගේ ජීවිත, ගව මහීෂාදී මෙන්ම වදුරු වසංගත ආදිය දුරුවීමේ ගුප්ත විද්‍යාත්මක යාන්ත්‍රණයක් පවතීද එහි අභ්‍යන්තර හරය කුමක්ද යන්න විමසුමට ලක්කිරීම පර්යේෂණයේ ගැටලුව වශයෙන් හැඳින්විය හැකිය.

### අධ්‍යයන ක්ෂේත්‍රය/නියැදිය

මධ්‍යම පළාතට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ දඩුබැඳිරුප්පාව ග්‍රාමය අපගේ අධ්‍යයන ක්‍ෂේත්‍රය වේ. දඹුල්ල කුරුණෑගල මාර්ගයේ ඉබ්බන්කටුව ජලාශය පසුකර මඳ දුරක් ගමන් කරන විට මෙකී ග්‍රාමය හමුවේ.අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් මඩාටුගම ප්‍රදේශය හා ගලේවෙල කලාවැවට  ආසන්නව දඩුබැඳිරුප්ප ගම පිහිටා ඇත. රත්මල්ගහඇල කළුන්දෑව කණ්ඩලම තිත්තවැල්ගොල්ල ආදී වූ අවට ගම් සමඟ දඩුබැදිරුප්ප ග්‍රාමවාසීහු දඹුලු විහාරයේ වතාවත් වෙනුවෙන් දුරාතීතයේ සිටම බද්ධව සිටිති.

මහනුවර ශ්‍රී දළදා මාළිගයේ පෙරහැරට අවශ්‍ය ඇහැළ අරටු මෙකී ග්‍රාමයෙන් සැපයු බව ගම්වාසීහු පවසති. වැව් දෙකක් අතර වූ රුප්පාවෙහි දඬුවැට බැඳ වටකළ හෙයින් දඩුබැඳි +රුප්ප දඩුබැඳිරුප්පාව නාමය සකස් වූ බව ජනප්‍රවාදයේ පවතී.

### දත්ත රැස්කිරීමේ විධික්‍රම/දත්ත විශ්ලේෂණ විධික්‍රම

මෙම අධ්‍යයනයේ මූලික ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර අධ්‍යයනය හා ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයයි. ක්ෂේත්‍ර අධ්‍යයනයේදී සහභාගීත්ව නිරීක්ෂණයත්, ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයනයත් යොදා ගැනුණි. මූලාශ්‍ර අධ්‍යයනයේදී  ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර  භාවිත විය. ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයේදී  ඇඳුරු පරම්පරාවන් සතුව ඇති අත්පිටපත්, පුස්කොළ පිටපත්, කෝල්මුර කවි, පූජාවිධි රටාව ඇතුළත් පිටපත් හා සම්මුඛ සාකච්ඡා තුළින් ලබාගත් තොරතුරු ද ද්විතීයික මූලාශ්‍ර වශයෙන් මේ සඳහා අදාළ මුද්‍රිත හා අමුද්‍රිත කෘති පරීශීලනය ද කරන ලදී.

පූජා කර්මය පැවැත්වූ ස්ථානයට ගොස් ආරම්භයේ සිට හමාර වනතෙක් පරීක්ෂාවෙන් නරඹා අවශ්‍ය තැන්වලදී ඡායාරූප ගැනීම, හඬපටවලට ගැනීම, ඊට සම්බන්ධ සම්පත් දායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම තුළින් අවශ්‍ය දත්ත රැස්කර ඒ සියල්ල අදාල විෂයට සම්බන්ධ මානව විද්‍යාත්මක න්‍යායන් සමඟ තුලනාත්මකව විශ්ලේෂණය කිරීම සිදුවිය.

**ප්‍රවේශය**

පූප මංගල්ලය හෙවත් කැවුම් මංගල්ලය විෂ්ණු දේවියන්ගේ පිහිට අපේක්ෂාවෙන් මාතුල දිසාවේ දඩුබැඳිරුප්පාව ග්‍රාමවාසීහු වාර්ෂිකව සිදුකරති. වදුරු වසංගත රෝග පීඩාදියෙන් විනිර්මුක්තව ගව මහීෂාදීන් ආරක්ෂාකර සශ්‍ය සම්පත් වර්ධනයට කායික මානසික ශක්තිය වර්ධනය කර පිහිටාධාර රැකවරණය සැපයූ බුදුන් ප්‍රමුඛ විෂ්ණු දෙවියන් විෂයෙහි තම නොඉදුල් ශස්‍ය සම්පත්තීන්හි අග්‍රකොටස ගෞරවයෙන් පවිත්‍රතාවයෙන් පුදාවැඩීම සිදුකරන්නේ කළගුණ සැලකීමේ සද්චේතනාවෙනි (Marette,1909). මාතලේ දිසාවට පමණක් ආවේණික සංකිර්ණ පූජාවිධි රටාවකින් යුත් මෙය ලක්දිව අන් කිසිදු ප්‍රදේශයක දක්නට නොමැති පූජා මංගල්ලයක් වීම විශේෂත්වයකි.

ඓතිහාසික මෙන්ම බෞද්ධ සංස්කෘතික රටාවකින් සැදුම්ලත් ජන සංඛ්‍යාවකගේ වාස භූමියක්වන මාතලේ දිසාවේ ඇදහිලි හා විශ්වාස මෙන්ම අභිචාර පද්ධතිය බෙහෙවින්ම සංකීර්ණ වූවකි. මෙහි දක්නට ලැබෙන පොදු පූජා විධි රටාව කොහොඹ යක් කන්කාරිය, බලියාග ශාන්තිය, වලියක් මංගල්ලය, අඩුක්කු පූජාව, කිරිඅම්මාවරු දානය, ගම්මඩු පූජාව, සොකරි නැටුම හා සුනියම් කැපිල්ල ආදි (දිසානායක,2010: 31-39) පූජා මංගල්ලයන් බොහෝ දුරට සමාන වූවකි.

මධ්‍යම පළාතේ මාතුල දිසාවට අයත් දඩුබැඳිරුප්ප ග්‍රාමය කෘෂිකාර්මික ජනතාවක් වෙසෙන ප්‍රදේශයකි. සශ්‍රීකත්වය උදෙසා තත් ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් දෙවියන් විෂයෙහි සිදුකරන පූජාකර්ම අතර පූප මංගල්ලය හෙවත් හෙවත් කැවුම් මංගල්ලයට හිමිවන්නේ වෙසෙස් තැනකි.

ගම වැව, වෙළ, ලන්ද, රක්ෂා කරන්නේත්, රෝගපීඩාදිය දුරුකරන්නේත්, ගව මහීෂාදී ආරක්ෂාකර සම්පත් වර්ධනය වන්නේත් එයම කරණ කොටගෙන ගමේ සශ්‍රීකත්වය ජනිත වන්නේත් කැවුම් මංගල්ලය වැනි පාරම්පරිකව අඛණ්ඩව සිද්ධකරනු ලබන පූජාකර්ම නිසා බවගැමියෝ විශ්වාස කරති. මෙකී ගැමි විඥානයට අනුව තත් ප්‍රදේශයේ පවත්නා ගම් තුලාන සියල්ලක් ම ආරක්ෂා වන්නේ විෂ්ණු දෙවියන්ගේ ඇල්ම බැල්ම නිරතුරු ලැබීමෙනි.

**කැවුම් මංගල්ලයේ ප්‍රභවය හා විකාශනය**

විෂ්ණු දෙවියන් උදෙසා පවත්වන මෙම සුවිශේෂ පූප මංගල්ලයට සම්බන්ධ ඓතිහාසික කතා පුවත් රාශියකි. ඒ අතර එක්තරා කාලයකදී දඩුබැදිරුප්ප ග්‍රාමයේ විසූ

ගම්වැසියන් මෙන්ම ගව මහීෂාදී සතුන්ද හිටිහැටියේ අතුරුදහන්වීමට පටන් ගත් අතර අතුරුදහන් වුවන් සොයා ගැනීමට ගම්වැසියන් අපොහොසත් වීමෙන් එය අමනුෂ්‍ය බලවේග යක් හේතුවෙන් සිදුවන්නක් බව ගම් වැසියෝ විශ්වාස කරන්නට වූහ. එදා මෙකී උවදුරෙන් ආරක්ෂා වීමට දඹුල්ල රජමහා විහාරයේ විෂ්ණු දෙවියන්ගේ පිහිට යැදීමට බාර හාර වීමට ඔවුන්ට සිදුවිය. එහිදී විෂ්ණු දෙවියන්ට කැවුම් හා සුවඳැල් කෙසෙල් පූජාවක් තබන බවට මුළු ගමම භාරවියයුතු බව ඔවුහු තීරණය කළහ. එසේ භාර වීමට ගම්වාසී මහළු මවකට වනයේදී හමුවූ දෙවිකෙනෙකුගෙන් උපදෙස් ලැබුණු බව ද ගැමියෝ විශ්වාස කරති.

මෙම මහළු මවගේ මඟ පෙන්වීම අනුව ගම්වාසීන් සියලුදෙනා එක්වී දඹුලුවිහාරයේ විෂ්ණු දෙවියන්ට තම ගමත් ගම්වැසියන් හා ගවමහීෂාදීන් ද රැක දෙන ලෙසට අයැද කැවුම් හා සුවඳැල් කෙසෙල් පූජාව වාර්ෂිකව සිදු කරති.

ලක්දිව වෙනත් කිසිදු ප්‍රදේශයක දක්නට නොමැති පූජා පරමාර්ථයක් හා පූජා විධි රටාවකින් සමන්විත මෙකී පූප මංගල්ලය මාතුළ දිසාවට දඹුල්ල ප්‍රදේශයට අනන්‍ය සාධාරණ වූවකි.

ගම්වාසීන් තුළ පවතින ජනප්‍රවාද සාධක අනුව පණ්ඩුකාභය රජු යක්ෂයින් වෙනුවෙන් කැවුම් මංගල්ලයක් පැවැත්වූ බව කියවේ.එකී ආදී කාලීන පූජා කර්මය වෙනත් මුහුණුවරකින් නැවත ස්මතුවීමක්දැයි මෙකී පූජා කර්මය පිළිබඳ විමසීමේදී පෙනීයයි. පණ්ඩුකාභය කුමරු තම මාමා වූ ගිරිකණ්ඩශිව හට පවරාදුන් ජනපදය මාතුල ජනපදය වී පසුව මාතලේ වූ බවද විශ්වාස කෙරේ(දිසානායක,2010: 30). පණ්ඩුකාභයගේ මාතුළ සම්බන්ධය හා ඔහු යක්ෂයින් වෙනුවෙන් කැවුම් මංගල්ලයක් පැවැත්වූවා යැයි පැවසෙන ජනප්‍රවාදයත් දඩුබැදිරුප්ප වාසීන් පවත්වන කැවුම් මංගල්ලයත් අතර පවතින සම්බන්ධය එතරම් පැහැදිලි නැත. නමුත් ඒ හා කිසියම් බද්ධතාවයකුත් පවතින්නේ යැයි සිතීමටද තුඩු දෙන සාක්ෂි වශයෙන් උක්ත ජනප්‍රවාද ඉදිරිපත් කළ හැකිය.

**පූජාවිධි රටාව**

දඩුබැදිරුප්ප වාසීන් පවත්වන මෙකී කැවුම් මංගල්ලය සංකීර්ණ පූජා විධි රටාවකින් සමන්විතය. එසේම එකී පූජා කර්මයටම ආවේණික වූ වත්පිළිවෙත් රැසක් ද දෘෂ්‍යමාන වීම විශේෂත්වයකි.

**පෙර සූදානම**

කැවුම් මංගල්ලය පැවැත්වීමට පළමු පූර්ව සූදානම් වීමක් ගම්වාසීන් තුළ දක්නට ලැබේ.

**දිනයක් නියම කිරීම**

මෙහි මූලික කටයුත්තක් වන්නේ දේව මංගල්ලයට දිනයක් නියම කරගැනීමයි. ගමේ ස්වාමීන් වහන්සේ ගමරාළ, කපුරාළ, අනුමැතිරාළ ඇතුළු ගමේ ප්‍රභූ පිරිස ගමේ සන්හිඳට එක්රැස් වී දේව මංගල්ලයට දිනයක් නියම කළ යුතුයි. පූප මංගල්ලය මැයි මාසයේ දඹුලුවිහාරයේ නානුමුර මංගල්ලය පැවැත්වීමෙන් පසුව එන සිකුරාදා සහ සෙනසුරාදා දිනය යොදා ගැනේ. දිනය නියම කරගැනීමෙන් පසු ගම්වැසියන් සියලුදෙනාටත් දඹුලුවිහාරයේ මහනායක ස්වාමීන් වහන්සේට සහ විෂ්ණු දේවාලයේ කපු මහතාට බුලත් නම්බුදී පූජා මංගල්ලය දැනුම්දීම අනතුරුව කරනු ලැබේ. එසේම තේව තොවිල්කරුවන්ට ආරාධනාකිරීමත් සිදුකෙරේ.

**පේ වීම**

ගම් වැසියන් බක්මාසයේ සිට මෙකී පූජාකර්මය සඳහා පේ වීම සිදුකළ යුතුය. සිංහල අලුත් අවුරුද්දෙන් පසුව ග්‍රාමයේ කිසිම නිවසක ගොමමැටි ගෑම කැවිලි හැදීම තෙල්වලං ලිප තැබීම කෙසෙල්කැන් ඉදවීම ආදී වූ කිසිදු කටයුත්තක් නොකිරීමට ගැමියෝ වගබලාග නිති. දින නියම කිරීමෙන් අනතුරුව ගම් වැසියන් සතියක් මුලුල්ලේ විශේෂ පෙහෙවස් වීමක් සිදුකරයි. මෙකී කාලය තුළ මහකැලේ යාමක්, මස්මාංශ අනුභව කිරීමක් නොකරන නොකරයි. දෙවියන් විෂයයෙහි පවත්නා ගැමියාගේ අව්‍යාජ ගෞරවය ඉන් විෂද වේ. ඉදිරියේ දී සිද්ධ කරනු ලබන දේව මංගල්ලයට පෙර සූදානම නැත හොත් පේවීම මේ අයුරින් සිදු කරන ගැමියා ගම් තුලානේ සියලුම නිවෙස්හි පංගුපේරුකරුවන් දෙවියන් සඳහා කැප කොට ඇති මුල් ම සහල් කොටස්, බුලත්පුවක් ඇතුළු අනෙකුත් අවශ්‍ය දෑ ගම් වැසියන්ගෙන් එකතුකර ගනියි.

**පූජා භාණ්ඩ රැස්කිරීම**

මංගල්ලය පැවැත්වීමට පෙර දිනයේ දී ගමේ පංගුකාරයෝ සියලු දෙනා තම තමන් භාරගත් සුවඳැල් කෙසෙල් ගෙඩි 300 ක් අතිරස කැවුම් 300 ක් අක්යාල හාල්, පොල්, නොයිඳුල් එළකිරි, මල් පහන්, හඳුන්කූරු, කපුරු, සුවඳ වර්ග, නැවුම් වළං හා සුදුපිරුවට යනාදී අවශ්‍ය සියලු පූජා භාණ්ඩ කපු මහතාගේ නිවසට සපයති.

කිරි අහර සකස් කිරීමට යොදාගන්නා අක්යාල සහල් කුඹුරෙන් නෙලාගන්නා ලද අස්වැන්නේ වෙන්කළ මුල්ම කොටස වීමද මෙහිදී සැලකිය යුතුය. කුඹුරේ ගොයම් පැසුණු කළ සියලුම ගොවියන් කරල් මිටක් කපාගෙනවිත් යහලේ තබන්නේ තම භෝගයන්ගේ අග්‍ර කොටස දෙවියන්ට පුදදීම උදෙසා ය. මුල්ම කොටස් විෂ්ණු දෙවියන් උදෙසා සිදුකරන පූප මංගල්ලය වෙනුවෙන් වෙන් කරන ඔවුහු, එම සහල්වලින් පූප මංගල්ලයේ කිරිදානය සකස් කරනු ලබති. ඒ සඳහා ගමෙහි සියලු දෙනාගේම දායකත්වය අනිවාර්ය වේ. ගමේ පට්ටි අයිතිකරුවෝ පට්ටියේ කුළුඳුල් දෙනුන්ගෙන් දොවාගත් කිරි ගෙනවිත් කපුමහතාට භාරදීම ද අනිවාර්ය කටයුත්තක් වෙති.

නියමිත දින උදාවීමත් සමඟ එදින සවස් භාගයේ මෙම මංගල්ලය සිදු කිරීමට බුලත් නම්බු ලැබූ මෙහෙවර කරුවෝ කපු මහතාගේ නිවසට තම භාණ්ඩද රැගෙන පැමිණෙති. බඩාල්රාළ තමා සැදූ මුට්ටි සුදුපිරුවටින් ඔතා කපුරාළට පිළිගන්වන්නේ ඉතා ගරුසරු ඇතිවය. බඩාල්රාළගේ මෙහෙවර මහන්සියට කපුමහතාගෙන් බුලත් හුරුල්ලක් මත තබා පඩුරුකි.

**මූලික සැරසිලි**

විෂ්ණු දෙවියන් අරභයා සිදුකරන මෙකී පූජා මංගල්ලයට ගම මෙන්ම ගමෙහි සිට පෙරහැර ගමන්ගන්නා මාර්ගයේ ද විශේෂ සැරසිලි රැසකි. ග්‍රාමයට පිසවිසුම් ස්ථානයේ හා ගම අවසන් මායිම් අසල ගොක්කොළ හා කෙසෙල් කඳන් උපයෝගී කරගනිමින් තොරණ් ඉදි කරනු ලැබේ. මෙම ඉදිකරනු ලබන තොරණ් "මණ්ඩප" නමින් හැඳින්වේ. එම තොරණෙහි හේමකඳ(දේවියන් උදෙසා රැගෙනයන පූජා භාණ්ඩ) තබා කන්නලව්ව කිරීමට හැකි පරිදි සකස් කිරීමට ගැමියෝ වගබලා ගනිති. විෂ්ණු දෙවියන් ප්‍රමුඛ සියලුම ගම්බාරදෙවිවරුන් උදෙසා ගමෙහි ප්‍රධාන කපුමහතාගේ නිවසේ ඉදිකරන පහන් පැලද සුවිශේෂත්වයක් දරණ පූජා සැරසිල්ලකි.



**ගම ආරම්භයේ සහ ගම අවසන් සීමාවේ ඉදිකරන ලද තොරණ**

**පූජාකර්මයේ ආරම්භය**

පූජා කර්මය සිදුකරන දිනට පෙරදින එනම් සිකුරාදා දින හැන්දෑ යාමයේදී සුදුපිරුවට වලින් ආවරණය කරන ලද සියලුම පූජා ද්‍රව්‍ය කපුමහතාගේ නිවසේ සාදන ලද පහන් පැලෙහි තැම්පත් කරති. කෙසෙල් කැන් ගොක්කොළ වලින් වියනලද පැසක බහා ඒවාද සුදු පිරුවටින් ඔතා සකස් කරනු ලැබේ.නැවුම් එළකිරි, කිරිඅහර පිසීමට අවශ්‍ය නැවුම් වළං, අක්යාල සහල් පොල්, තෙල්, පහන්, හඳුන්කූරු ආදී සෑම සියලු පූජා ද්‍රව්‍යයක්ම පහන්පැලෙහි තැම්පත් කරනු ලැබේ.



**පුජා ද්‍රව්‍ය තැම්පත්කළ පහන් පැල**



**කෙසෙල් කැන් ගොක්කොළ පැසක බහාලීම**

එදිනට පැමිණෙන සියලුම දෙනාට කපුමහතාගේ නිවසේ පිළිහුඩුවලින් තොර දානය ලබාදීම සම්ප්‍රදාය වේ. මෙකී රාත්‍රි දානයෙන් පසුව පැමිණ සිටින සියල්ලෝම ඉස්සෝදා නා පිරිසිදු වී සුදුවතින් සැරසී පෙරහැර සඳහා සහභාගි වීමට මධ්‍ය රාත්‍රියේ කපුමහතාගේ නිවසට එක්රැස් වේ.

මංගල්ලය සිදු කරන දිනයේ දී ගමෙන් පිටත සිටින අයගේ පැමිණීම අනිවාර්යය. මෙම චාරිත්‍ර නොතකන අය දේව උදහසට ලක්වන බව ගම්මු තරයේ විශ්වාස කරති. කැවුම් මංගල්ල කටයුත්ත සඳහා ගම් තුලානේ කණවැම්දුම් ස්ත්‍රීන් පවා සහභාගිවීම අනිවාර්ය වේ. ගම් තුලානේ ජීවත් වන්නන් අතර කුමනාකාරයේ සිත් අමනාපකම්, නොහොඳ නෝක්කඩු, කුලමල භේද පැවතිය ද මෙම දේව මංගල්ල දිනයේ දී ඒ සියල්ල අමතක කොට සාමූහිකව කටයුතු සිද්ධ කළ යුතු ය.

සියලුම ගම් වැසියන්ගේ දායකත්වයෙන් යුතුව සිද්ධ කරනු ලබන මෙම දේව මංගල්ලයට කිසියම් ගම් වැසියෙක් සහභාගී නොවන්නේ නම්, ඔහු හෝ ඇය ගමේ සියලු වැදගත් කටයුතුවලින් ඉවත්කරනු ලබයි. එවන් පුද්ගලයන් හිර තියපු අය ලෙස ගැමියා හඳුන්වයි. ගමේ ගැමියන් සමඟ දොඩමළු වීම, ආවාහ විවාහ කටයුතුවලට සම්බන්ධවීම ආදී කිසිවකටත් හිරතියපු තැනැත්තාට සම්පූර්ණයෙන් තහනම්වේ. ගමේ ගැමි නීතිය රජයේ නීතිය පරයන්නේ මෙවන් අවස්ථාවල දී ය.

මධ්‍යම රාත්‍රිය ගෙවී හෝරාවක් පමණ ගතවෙද්දී කපුමහතා තම නිවසේ පහන් පැලෙහි පහන් දල්වා සුවඳදුම් අල්ලා දේවාරූඪයෙන් තේවාව පවත්වා දේව මංගල්ලයේ පුජා ද්‍රව්‍ය දැකුම් පඩුරු තබා නවවැදුම් වැඳ දෙවින්ට කැපකරනු ලබයි.

අනතුරුව පෙරහැර ආරම්භ වේ. ගමේ වෙදරාළ පන්සලේ නායක ස්වාමීන් වහන්සේ දේවාලයේ ප්‍රධාන කපු මහතා බෙරවාදකයෝ හේවිසිකරුවෝ ඇතුළු ගම්වාසීහු සියලුදෙනා කිසිදු භේදයකින් තොරව මේ සඳහා සහභාගී වෙති. සියලු පුජා ද්‍රව්‍ය සුදුපිරුවටින් ආවරණය කොට උඩුවියන් මතින් පෙරහැරේ වඩමවනු ලබන්නේ ඉමහත් ගෞරව භක්තියකිනි.



**තේවාව පවත්වා දෙවියන් වෙනුවෙන් පූජා ද්‍රව්‍ය කැප කිරීම**



**පූජා ද්‍රව්‍ය රැගත් පෙරහැර**

ගම් සීමාවේ ඉදිකරන ලද ප්‍රධාන තොරණ් දෙකෙහි සුවඳැල්කෙසෙල් හා කැවුම් සහිත හේමකත් තැම්පත්කර නැවත තේවාව සිදුකරන්නේ ගම්කොටුවත් ගම්වැසියනුත් ගවමහීෂාදීනුත් විෂ්ණු දෙවියන් ප්‍රමුඛ ගම්කොටුවට අරක්ගත් අල්පේශාඛ්‍ය මහේශාඛ්‍ය සියලු දෙවිදේවතාවන්ට කැපකරමිනි. දඩුබැඳිරුප්ප ග්‍රාමයෙන් ආරම්භවන මෙම පෙරහැර ඉබ්බන්කටුව ජලාශය මාර්ගයේ පැමිණ දඹුල්ල කුරුණෑගල මාර්ගයෙන් ශ්‍රී වළගම්බා පිරිවෙනට පිවිසෙන මාවතෙහි පැමිණ දඹුලුරජමහා විහාරයට පැමිණෙනු ලබන්නේ පාද චාරිකාවෙන් පමණක්ම වීමද ගැමියන්ගේ  දේව භක්තිය විදහා පාන්නකි.

හිමිදිරි පාන්දර තුන පමණ වනවිට දඹුලුවිහාර භූමියට පූජා ද්‍රව්‍ය රැගත් මෙම පෙරහැර ප්‍රවිෂ්ඨ වීම සම්ප්‍රදාය වේ. අනතුරුව දඹුලුරජමහා විහාරාධිපති වහන්සේගේ සහ විෂ්ණුදේවාලයේ කපු මහතාගේ සහයෙන් ඉතිරි පූජා කටයුතු ආරම්භ කරනු ලැබේ.

රැගෙන එන ලද අක්යාල සහල් පොල් සහ එළකිරි යොදා දේවාල භූමියේ විෂ්ණු දෙවියන් උදෙසා කිරිදානය සකස් කිරීම ආරම්භ කරන්නේ මෙතැන් සිටය. කිරිදානය මෙකී පූජා කර්මයට ඇතුළත් කිරීමට හේතුකාරණාවක් විය. එනම් ගම් වාසීන්ගේ ගවයින් හිටි හැටියේ අතුරු දහන් වීමයි. එයින් සිය කෘෂි කාර්මික කටයුතු සඳහා මහත් බාධාවක් පැනනැගුණි. අද මෙන් යන්ත්‍රෝපකරණ නොවූ අතීතයේදී සියලු ගොවිතැන් කටයුතු සේම ගමන් බිමන් යාමට කිරිටික ලබා ගැනීමට ආදී වූ ගැමි ජීවිතයේ කුදුමහත් මෙහෙවර උදෙසා ගවයාගේ උපකාරය ගැමියාට මහත් අස්වැසිල්ලක් විය.නමුත් මෙවැනි සමාජ යාන්ත්‍රණයක් තුළ ගවයින් අතුරුදහන් වීමේ උවදුරෙන් ඔවුන් රැක ගැනීමට විෂ්ණු දෙවියන්ගේ ආරක්ෂාව පැතීමට මෙකී ගැමියෝ උත්සුක වූහ. ගවමහීෂාදීන්ගේ උපකාරයෙන් තම කෘෂිකර්මික කටයුතු සාර්තක කරගැනීමට හැකි වූ හෙයින් නොයිදුල් අස්වැන්නේ කොටසක් සහ  නොයිදුල් කිරි මුසු වූ කිරිදානය සකසා එම කිරෙන් සැකසූ ගිතෙල් පහන්ද විෂ්ණු දෙවියන්ට පූජා කිරීමට ගැමියෝ ක්‍රියා කරනු ලබති. එසේ පූජා පවත්වා ඔවුන් විෂ්ණු දෙවියන්ගෙන් ඉල්ලා සිටින්නේ කෘෂිකර්මාන්තය සාර්තක කරගැනීමට ගවමාහීෂාදීන් රැකදෙන ලෙසයි. අතීතයේදී ඇතැම්විට දෙවියන් උදෙසා සත්ව බිලි පූජා පවතින්නට ඇති වබට සාක්ෂි පොම්පරිප්පු

සුසානයේවූ සත්ව ඇටකටු තුළින් ලැබුනද බෞද්ධාගමික සංස්කෘතිය ස්ථාපිත වීමත් සමඟ අවිහිංසාවාදී ක්‍රමවේදයක් ඔස්සේ දේව වන්දනය ප්‍රතිනිර්මාණය වූවාට සැකනැත.



**කිරි අහර සකස් කිරීම**



**කිරි අහර සහිත කැවුම් හා කෙසෙල් පූජාව බුදුන් හා දෙවියන් විෂයෙහි වැඩමවීම**

පුරුෂ පක්ෂය පමණක් පිළියෙළ කරගත් කිරිඅහර පළමුව බුදුන් වහන්සේට පූජාකර පසුව තමන් විසින් රැගෙන ආ කැවුම් 300 පූජාව සහ සුවඳැල් කෙසෙල් 300 හේමකත් පිසින ලද කිරි අහරද සමඟින් යාතිකා කන්නලව් කියා ශබ්ද පූජා මධ්‍යයේ විෂ්ණු දෙවියන්ට පුදනු ලබන්නේ තවත් වර්ෂයක් පුරාවට ගමත් ගැමියනුත් ගවමහීෂාදීනුත් විෂ්ණු දෙවින්ට භාර කරමිනි.





**විෂ්ණු දෙවියන් උදෙසා කැවුම් කෙසෙල් සහිත කිරිඅහර පූජා කරන ගම් වාසීන්**

**පූප මංගල්ලයේ නිමාව**

අනතුරුව ගම්වාසී සියලුදෙනාටම කපුමහතා විසින් ආරක්ෂක නූල් පළඳනු ලැබේ. දෙවියන්ගේ පූජාව අවසන් වූ පසුව පැමිණ සිටින සියලුම දඹුබැදිරුප්පාව ගම්වාසීන් අවට ගම් වූ රත්මල්ගහඇල තිත්තවැල්ගොල්ල කළුන්දෑව වහකෝට්ටේ මැදබැද්ද ආදී ගැමියන්ද සමඟ දේව දනය අනුභව කොට විසිර යන්නේ ඉදිරි වර්ෂයේ දේව දානයටද බාර හාර වෙමිනි.

## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය මුල්බැස ඇත්තේ කෘෂිකාර්මික සභ්‍යත්වය තුළය. එකී කෘෂි සංස්කෘතියේ සදාචාරාත්මක සංහිදියාව බෞද්ධ සංස්කෘතියේ ආභාෂයත් සමඟින් පූර්ණත්වයට පත්විය. හෙළ ජන හදවත් තුළ පැවති ආකල්ප ඇගයීම් පුරුෂාර්ථයන් බෞද්ධ සංස්කෘතිය තුළින් කලඑළි විය. ඔවුහු තම සිතුම් පැතුම් චර්යාවන් ඒ අනුව සකසා ගත්හ (බෝපේගෙදර, 2004).

විසරණය, සංක්‍රමණ හා නව සොයාගැනීම් හේතුවෙන් සංස්කෘතීන් නිරන්තර විපර්යාසයට පත්වීම නොවැලැක්විය හැකි සාධකයකි. එවන් යුගයක සිංහල සංස්කෘතික අනන්‍යතාව විනිවිද පෙන්වාලන අවිනෂ්ට අභිචාර ශේෂයන් රැකගැනීම හා සංරක්ෂණය කිරීමත් සමාජ ආරක්ෂණය පිළිබඳ සිංහල ගැමි සමාජය සතු සාම්ප්‍රදායික ඥාන සම්භාරය විමර්ශනය කිරීමත් වැදගත් වේ. එමගින්

- සහභාගීත්ව නිවාරණය (participatory micanisam)
- භෞතික සම්පත් විෂයෙහි ඇතිවන රෝග උපද්‍රව නිවාරණය කිරීම මෙන්ම මිනිස් මනස සකස් කිරිම හා ශක්තිමත් කිරීම.
- සමාජ ප්‍රාග්ධන නිපැයුම (culture capital/social capital)
- මනස සකස් වී ශක්තිමත් වුවද තවදුරටත් රෝග නිවාරණය සඳහා ශක්තිමත් මනසක් සහ ශක්තියක් ගොඩ නැගීම
- සමාජ සාධක වලට පිළිගත හැකි වටිකානමක් ලබා දීම (social oder value)
- සමාජයේ යහපැවැත්මට අවශ්‍ය වූ භෞතික වූත් අභෞතික වූත් සාධකයන් කෙරහි සාමූහික විඤ්ඤානයන් ජනිත කිරීම (colectiv conoconsciousness)
- පාරම්පරික ඥාන සම්භාරය නවපරපුරට සම්ප්‍රේෂණය කිරීම (indgenes knowlage)
- සමාජ ස්ථර අතර ඒකාග්‍රතාවයක් ගොඩ නැගීම හා අන්තර් සම්බන්ධතා තහවුරු කිරීම (intanel asimination)

ආදී අභ්‍යන්තර සමාජ හරපද්ධතීන් රාශියක් මේ තුළ ගැබ්ව තිබීම විශේෂත්වයකි. ලොව විවිධ ජාතින් සාමුහික සමාජ ශුභ සිද්ධිය උදෙසා මෙවැනි අභිචාරාත්මක කටයුතු වල නියැලීම ප්‍රකට සමාජ සංසිද්ධියක් ලෙස සඳහන් කිරීම යුක්ති යුක්ත වේ.

පොදුවේ සලකන විට මෙකී අභිචාර විධි මගින් ආරක්ෂාව මතු නොව පවිත්‍රත්වය, ගාම්භීරත්වය හා ජයග්‍රහණය පිළිබඳ දැඩි විශ්වාසයක් මෙන් ම පෞද්ගලික හා සමාජ කටයුතුවල දී ද ඉතාමත්ම වැදගත්වන්නා වූ නිසිකලට වේලාවට කටයුතු කිරීමේ සංවිධානාත්මක භාවය ගොඩනැගීමට ද මහෝපකාරී වන සංස්කෘතික යාන්ත්‍රණයක් යැයි කිවහැකිය.

අතීත මුතුන්මිත්තන්ගේ සිට පැවතෙන්නා වූ මෙම විෂ්ණු දේව වන්දනය අදෘෂ්‍යමාන ව්‍යසන දුරිභූත කිරීමෙහිලා තත් සමාජ සංස්කෘතික සන්දර්භයෙහි චිරාත්කාලීනව පරිහරණය ප්‍රතිකර්මයක් ලෙස සාධනීය ඵල උදාකරනු බව අපගේ අධ්‍යයන තුළින් අනාවරණය විය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආරියපාල, එම්.බී. (1962).සමකාලීන ලංකා සමාජය, ලංකාණ්ඩු මුද්‍රණාලය.

දිසානායක, මුදියන්සේ.(2003) දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම, කොළඹ: එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, වසන්ත. කේ (2010). උඩරට කඩවර යක් කන්කාරිය හා සමාජය. කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඇඳගම, පණ්ඩුල (2006). (සංස්) හෙළමග විසිතුරු. කොමර්ෂල් බැංකුව.

බෝපේගෙදර ඒ. එම් .ආර්. (2004) විද්‍යාවෙන් ඔපවන අපගේ විශ්වාස හා ඇදහිලි. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

රත්නායක, අබේ (1999), සමාජවිද්‍යා මානව විද්‍යා න්‍යාය, පළමු කොටස, මහනුවර: ප්‍රින්ටෙක් මුද්‍රණාලය.

විජේසූරිය එස්. (1997). ශ්‍රී ලංකාවේ ජන සංස්කෘති, නුගේගොඩ, දීපානි මුද්‍රණාලය.

Adikaram E.W. (1946) Early history of Buddhism in Ceylon: Colombo,

The Ceylon daily news.

Bauman Richard. (1992). (Ed), folklore Cultural performances and popular Entertainments, Newyork: Oxford university press.

Bell, H.C.P. Sinhalese customs and ceremonies connected with paddy cultivation in the low-country, journal of the ceylone Branch of the royal Asiatic society, vol-viii, 1883-1884.

Frazer, James George, (1994).The Golden Bough, London: Chancellor Press, Michelin House.

Frazer, James George (1917). “The magic arts”, London.

Malinowski Bronislaw, (1935).Coral gardens and their magic vol .2. Working:

American Book Company printed in great britian by Unwing Brother Ltd.

Ivers, R.W. (1880).Custom and ceremonies, connected with paddy cultivation, journal of the Ceylon branch of the royal Asiatic society.vol VI.

Loomis Havemeyer, (1916).The Drama of savage people, New Hover

Marette R.R. (1909). The threshold of Religion

Obeyesekere, Gananath, (1963).The Great Tradition and the Little in the perspective of Sinhalese Buddhism , The Journal of Asian studies,volume xxii, No 2.

Tylor, Edward B, (1920).Primitive Culture, vol ii, London, John Murray, Acbemarle Street.